# සංස්කෘතීන් වෙනස්වීම

රෙඩ්ෆීල්ඩ් තම මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය යන සංකල්ප ඇසුරෙන් නිර්මාණය කරගත් ප්‍රවාදය එතරම් ශක්තිමත් නොවන බව ලංකාවේ ඔහුගේ අනුකාරකයනට නොතේරුණ ද ඔහුට යම් පමණකට හෝ තේරුම් ගොස් තිබූ බව පැහැදිලි ය. චූල සම්ප්‍රදායත් මහා සම්ප්‍රදායත් සමගාමී ව තිබිය හැකි බව පෙන්වාදීමට ඔහු ඇතැම් අවස්ථාවල දී උත්සාහ ගෙන ඇත්තේ එබැවිනි. එහෙත් ඔහු නොකියන දෙයක් වෙයි. එනම් සමාජයක මහා සම්ප්‍රදායේ හා චූල සම්ප්‍රදායේ අංග තීරණය කෙරෙන්නේ කෙසේ ද යන්න ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇතැම් අංග ලෝකයේ අනෙක් සමාජ මත අධිපතිවාදී ව පැතිරවීම සඳහා නිර්මාණය කෙරී ඇති රෙඩ්ෆීල්ඩ්ගේ මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය අප විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එහෙත් මතක තබාගත යුතු කරුණ නම් අප ප්‍රතික්ෂෙප කළ පමණින් ඒ සමාජයෙන් ප්‍රතික්ෂෙප නොවන බව ය. රෙඩ්ෆීල්ඩ්ගේ ප්‍රවාදය නැතිනම් එවැනි වෙනත් ප්‍රවාදයක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය වෙයි. එබැවින් පරස්පර ඉතා දැඩි නොවේ නම් එවැනි ප්‍රවාදයක් බටහිරයන් විසින් ප්‍රතික්ෂෙප නො කෙරෙයි.

සංස්කෘතියක් නිර්මල නොවන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ඇතැමුන් කෙසේ කීව ද අපි නිර්මල සිංහල සංස්කෘතියක් ගැන කිසි දිනෙක සඳහන් කර නොමැත්තෙමු. මාර්ටින් වික්‍රමසිංහ මහතා නිර්මල සිංහල සංස්කෘතියක් ගැන සඳහන් කර ඇති බව සැබෑ ය.  එහෙත් වෙනත් සංස්කෘතීන් සමග මිශ්‍ර නොවන හෝ නොවූ හෝ සංස්කෘතියක්වත් වෙනස් නොවන සංස්කෘතියක්වත් ලෝකයේ නැත. එවැන්නක් ඇතැයි සැලකීම පවා සිංහල ථෙරවාද බුදුසමයට එකඟ නො වෙයි.

සංස්කෘතීන්, සුසමාදර්ශ (paradigms), චින්තන ආදී මේ සියල්ල වෙනස් වෙයි. ඒ සියල්ල අනිත්‍ය වෙයි. එපමණක් නො වෙයි. සිංහල ථෙරවාද බෞද්ධයකුට වෙනස් නොවන ශක්තියක්, ගම්‍යතාවක් ගැන පවා සිතිය  නො හැකි ය. ශක්ති සංස්ථිතිය, ගම්‍යතා සංස්ථිතිය ආදිය සිංහල බෞද්ධ විද්‍යාවක තිබිය හැකි නො වෙයි. විවිධ වර්ගවල ශක්තිවල එකතුව කාලය අනුබද්ධයෙන් වෙනස් නොවන්නේ යැයි පැවසෙන්නේ බටහිර ක්‍රිස්තියානි විද්‍යාවෙහි ය. එහි පසුබිමෙහි ඇත්තේ දෙවියන් වහන්සේ විසින් මවන ලද ශක්තිය එකතුවක් ලෙස ගත්කල වෙනස් නොවන බව ය. වෙනත් වචනවලින් කියන්නේ නම් දෙවියන් වහන්සේ ශක්තිය මැවීමෙන් පසුව ඒ ඒ ශක්තිය වෙනත් ශක්තීන්ට පරිවර්තනය කළ හැකි මුත් මුළු මහත් ශක්තියට අළුතින් ශක්තියක් එකතුකිරීමටවත් ඇති මුළු ශක්තියෙන් සුළු ප්‍රමාණයක්වත් අඩුකළ නොහැකි බව ඉන් කියැවෙයි. ශක්තිවල එකතුව නියතයක් නම් ඒ නිත්‍ය වෙයි. අනිත්‍ය නො වෙයි. සාපේක්ෂ සත්‍යයක් ලෙසවත් සිංහල බෞද්ධයනට එවැනි නිත්‍යතාවක් පිළිගත හැකි ද?

ඇතැමුන් කියනු ඇත්තේ ශක්ති සංස්ථිති නියමය නිවැරදි බව පරීක්ෂණාගාරයෙහි දී හෙළි වී ඇති බව ය. එසේත් නැත්නම් වෙනත් වචනවලින් කියන්නේ නම් ශක්ති සංස්ථිති නියමය පරීක්ෂණාගාරයෙහි දී සත්‍යාපනය කෙරී ඇති බව ය. එහෙත් ඒ එසේ යැයි කිවහැකි නො වේ. පරීක්ෂණාගාරයෙහි දී යම් නිවැරදිතාවකින් ශක්ති සංස්තිථි නියමය සත්‍යාපනය කෙරී ඇති බව සැබෑ ය. එහෙත් ඉන් කියැවෙන්නේ කිසිදු සන්නිකර්ෂණයකින් තොරව ශක්ති සංස්ථිති නියමය සත්‍යාපනය කෙරී ඇති බව නො වෙයි. අනෙක් අතට විශ්වයේ සෑම තැනම සෑම කල්හි ම ශක්ති සංස්ථිති නියමය කිසිදු සන්නිකර්ෂණයකින් තොරව සත්‍යාපනය කෙරී ඇති බව නොවෙයි.

මෙහි දී මතක තබාගත යුතු කරුණක් නම් මෙහි අනිත්‍ය යන්න සඳහන් වන්නේ නිත්‍ය නොවන අර්ථයෙන් පමණක් බව ය. අනිච්ච, දුක්ඛ අනාත්ම යනු සංකල්පවත් නොවන බව අවධාරණය කළ යුතු ය. එවැනි ගැඹුරු ධර්මයක් පිළිපදින සිංහල බෞද්ධයකුට නිර්මල සිංහල සංස්කෘතියක් තිබිය නො හැකි ය. සංස්කෘතීන් කාලයත් සමග වෙනස්වන බව පිළිගන්නා අපි සංස්කෘතීන් වෙනස්වන්නේ කෙසේ දැයි සලකා බලමු. සංස්කෘතියක් (චින්තනයක්) අභ්‍යන්තර හේතු නිසා වෙනස්විය හැකි ය. එසේ නැතහොත් බාහිර කරුණු නිසා වෙනස් විය හැකි ය. (මේ ඇතැම් දෑ මගේ ලෝකය කෘතියෙහි විස්තර කෙරෙයි.)

© Prof. Nalin De Silva

සංස්කෘතියක ජීවත්වන යම් අයකු සංස්කෘතියට අළුතින් යමක් නිර්මාණාත්මක ව එකතුකිරීමට ඉඩ ඇත. ඒ එකතුකිරීම සමාජයට (එනම් සංස්කෘතියට) අවශ්‍ය නම් සමාජයෙහි අනෙක් අය ඒ පිළිගනු ඇත. එසේත් නැතහොත් සමාජය විසින් ඒ බැහැර කෙරෙනු ඇත. මෙහි සාකච්ඡා කිරීමට පවා දෙයක් නැත. ඕනෑම නිර්නාණයක් කෙරෙන්නේ යම් සංස්කෘතියක මිස රික්තයක නො වේ. එසේ වුවත් යම් නිර්මාණයකින් පසුව ඒ සංස්කෘතිය තවදුරටත් මුල් සංස්කෘතිය ලෙස ම නොපවතින බව පැහැදිළි ය. සංස්කෘතියක නිර්මාණය වන්නක් බිහිවන්නේ සංස්කෘතිය ද වෙනස් කරමින් ය. අනෙක් අතට සංස්කෘතියක තිබෙන යම් ලක්‍ෂණයක් සමාජය විසින් අත්හරිනු ලැබීමට ඉඩ ඇත. එසේ යම් ලක්‍ෂණයක් අත්හැරීමෙන් පසුව ද ලැබෙන්නේ මුල් සංස්කෘතියට වඩා වෙනස් සංස්කෘතියකි.

ඒ අභ්‍යන්තර ව ගත්කල සංස්කෘතිය වෙනස්වීම ය. රටක සමාජයක සංස්කෘතිය බාහිර සංස්කෘති නිසා ද වෙනස් විය හැකි ය. එසේ වෙනස්වීම් කිහිප ආකාරයකට සිදුවෙයි. වෙනත් යම් සංස්කෘතියක සමාජයක පිරිසක් රටට සංක්‍රමණය වීමෙන් රටක සංස්කෘතිය වෙනස්විය හැකි ය. දෙවැනුව යම් රටක ප්‍රභූන් හෝ වෙනත් පිරිස් වෙනත් රටක සංස්කෘතියක් අනුකරණය කිරීමෙන්, එනම් ඒ වෙනත් සංස්කෘතියක අංග ලබාගැනීමෙන් සංස්කෘතිය වෙනස්විය හැකි ය. එසේත් නැතහොත් රටක් ආක්‍රමණය කරන පිරිස ඒ රටෙහි තම සංස්කෘතියෙහි විවිධ අංග දේශපාලන ආධිපත්‍යය යෙදවීමෙන් ප්‍රචලිත කිරීමට කටයුතු කළ හැකි ය.

එහෙත් මේ අතර සංක්‍රමණය කළ පිරිසෙහි සංස්කෘතිය ද වෙනස්විය හැකි ය. එසේ වෙනස්වන්නේ තමන් සංක්‍රමණය වූ රටෙහි ඇතැම් සංස්කෘතිකාංග අවශෝෂණය කිරීමෙනි. යටත්විජිතවාදී ව තම සංස්කෘතිකාංග වෙනත් රටවලට බලයෙන් පටවන සමාජයක් වුවත් තමන් පාලනයට නතුකරගත් ප්‍රදේශයෙහි සංස්කෘතිකාංග අවශෝෂණය කිරීමෙහි යම් සම්භාවිතාවක් වෙයි. ඒ සඳහා ආක්‍රමණික පිරිස දිගින් දිගට ම ඔවුන් විසින් ආක්‍රමණය කරනු ලැබූ රටෙහි ජීවත්වීම අවශ්‍ය නො වෙයි.

උදාහරණයක් වශයෙන් ගත්කල අද යුරෝපීය ජාතිකයන් බොහේ දෙනාගෙ සංස්කෘතියෙහි ආසියාතික සංස්කෘතික ලක්‍ෂණ දකින්නට ඇත. විශේෂයෙන් ම ආහාර පාන ආදිය සම්බන්ධයෙන් එවැන්නක් සිදු වී තිබේ. සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් යම් අංග අවශෝෂණය කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වෙයි. ඒ විවිධාකාරයෙන් සිදුවෙයි. ආක්‍රමණිකයා ආක්‍රමණයට ලක් වූ සංස්කෘතියෙන් ද යම් යම් අංග උකහා ගන්නේ ඊනියා මහා සම්ප්‍රදායකට අනුකූල ව නො වෙයි.

මේ කරුණු බොහෝමයක් දැනට අවුරුදු තුන්දහස් පන්සීයයකට පමණ පෙර දඹදිව සිදු වූ ක්‍රියා මාර්ගයක් විශ්ලේෂණය කිරීමෙන් දැනගත හැකි ය. ආර්යයන් නමින් හැඳින්වෙන මිනිසුන් එකල දඹදිවට පැමිණ ඇත. ඔවුන් එහි එන විට දඹදිව සිටි ජනතාව අප විසින් හැඳින්වෙන්නේ අනාර්ය හෝ පූර්ව වෛදික නමින් ය. ඔවුහු විවිධ ගෝත්‍රවලට අයත්වූහ. එහෙත් ද්‍රවිඩ නො වූහ. ද්‍රවිඩ නමින් හැඳින්වෙන්නන් දඹදිවට පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව පන්සීයේ දී පමණ, එනම් දැනට අවුරුදු දෙදහස් පන්සීයයකට පමණ පෙර ය. ද්‍රවිඩයන් දඹදිවට පැමිණ ඇත්තේ බටහිර ආසියාවෙන් හෝ උතුරු අප්‍රිකාවෙන් හෝ බවට මත වෙයි. ඉතිහාසඥයකු වූ නිලබණ්ඨ ශාස්ත්‍රී මහතා මේ සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත. ද්‍රවිඩයන් ඒ ප්‍රදේශ දෙකෙන් කිනම් ප්‍රදේශයකින් පැමිණිය ද, ඔවුන් වර්තමාන පකිස්ථානය අසළ පිහිටි බ්‍රාහි නම් ප්‍රදේශයෙහි කලක් වාසය කර ඇත. අද ද එහි ද්‍රවිඩ භාෂාවක් කතාකරන ජනවර්ගයක් වාසය කරන බව නීලබණ්ඨ ශාස්ත්‍රී මහතා පවසයි.

ආර්යයන් යනු ජනවර්ගයක් හෝ ජාතියක් හෝ නොවන බව වත්මන් උගතුන්ගෙ පිළිගැනීම ය. ඔවුහු දඹදිවට යම් සංස්කෘතියක් ගෙන ආහ. එමෙන් ම ඔවුන් යම් භාෂා ද ගෙනැවිත් ඇති බව පැහැදිළි ය. ඔවුන් පැමිණ ඇත්තේ ඉරානය හෙවත් පර්සියාව හා ඒ අවට ප්‍රදේශවලින් ය. ඔවුන් අශ්වයන් පිට යෑමේ දක්‍ෂයන් වී යැයි කියනු ලැබෙයි. ආර්යයන් දඹදිවට පැමිණීමට වසර පන්සීයයකට පමණ පෙර යක්‍ෂ ගෝත්‍රිකයන් ද දඹදිවට පැමිණ ඇති බවට සාක්‍ෂි වෙයි. යක්‍ෂ ගෝත්‍රිකයන් පැමිණ ඇත්තේ බටහිර පර්සියාවෙන් හෝ පර්සියාවට බටහිර පෙදෙසකින් ය. නාග ගෝත්‍රිකයන් ද එසේ දඹදිවට පැමිණි තවත් ගෝත්‍රිකයන් පිරිසක් ලෙස සලකනු ලැබෙයි.

© Prof. Nalin De Silva

දඹදිව මුල් පදිංචිකරුවන් කවුද යන ප්‍රශ්නයට මින් පිළිතුරු නො ලැබෙයි. එහෙත් දැනට අවුරුදු හාරදහසකට පෙර මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතිය ගොඩනැගුවන් දඹදිව සිටි බව පැහැදිළි ය. මොහෙන්ජදාරෝ හරප්පා අද අයත්වන්නේ පකිස්ථානයට බව ද අමතක නොකළ යුතු ය. පකිස්ථානය මුස්ලිම් වුයේ මෑතක බව පැහැදිළි ය. මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතිය ද අනාර්ය එහෙත් ද්‍රවිඩ නොවන සංස්කෘතියකි. එය ද පූර්ව වෛදික සංස්කෘතියකි.

මොහෙන්ජදාරෝ හරප්පා කැටයම්වල  භික්ෂුන් වහන්සේලා මෙන් සිවුරු පෙරවූ අය ද ඇසතු (බෝ) ගස් ද නිරූපණය වන බව මානි ජෝෂි මහතා සඳහන් කරයි. එතුමා සඳහන් කරන ආකාරයට ගෞතම බුදුන් වහන්සේට පෙර වැඩවිසූ බුදුන් වහන්සේලා හය නමක් පිළිබඳ ව පැරණි බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. ඇතැම් විට කාශ්‍යප බුදුන් වහන්සේගේ සසුනෙහි යම් යම් ලක්ෂණ ඒ කැටයම්වලින් නිරූපණය වනවා විය හැකි ය. පෙර විසූ ජෛන මුනිවරුන් ගැන ද කියැවෙන බැවින් ඒ කැටයම්වල ජෛන ආගමික ලක්ෂණ ද තිබෙනු හැකි ය. කෙසේ වෙතත් ආර්යයන් හා යක්ෂයන් දඹදිවට සංක්‍රමණය වීමට පෙර වූ මුනිවරුන් ද ඇතුළත් ශ්‍රමණ සංස්කෘතියක් පිළිබඳ ඉඟි මොහෙන්ජදාරෝ හරප්පා නටබුන්වලින් පිළිබිඹු වන්නේ යැයි කිව හැකි ය.

අපට සාකච්ඡාකිරීමට ඇත්තේ ආර්යයන් දඹදිවට පැමිණීමෙන් පසුව ඇතිවූ සංස්කෘතික වෙනස්කම් කවරේ ද යන්න ය. යක්ෂ ගෝත්‍රිකයන්ගේ සංක්‍රමණයෙන් දඹදිව විශාල වෙනස්කමක් වූ බවට සාක්ෂි නො මැත. ඔවුන් තම සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් හෝ ජෛන සංස්කෘතිය වැළඳගෙන හෝ ජීවත්විණි යැයි සිතන්නට ඉඩ ඇත. ඔවුන් අතින් දඹදිව සංස්කෘතිය විශාල වෙනසකට භාජනය නොවන්නට ඇත. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් ලංකාවේ නම් ඔවුන්ගේ සංස්කෘතිය තහවුරුකිරීමට කටයුතු කර ඇති බව පෙනී යයි. එමගින් ඔවුන් ලංකාවේ සංස්කෘතිය ද යම් ප්‍රමාණයකට වෙනස් කරන්නට ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva